## ශ්‍රී ලාංකීය තරුණ ප්‍රජාවට ව්‍යවසායකත්ව මාර්ග පාදා ගැනීමට සහාය වෙමින්, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ලංකා වාණිජ මණ්ඩලය නව හවුල්කාරිත්වයට අවතීර්ණ වෙයි

*ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින්, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවෙහි මූල්‍යමය අනුග්‍රහය සහිතව, ක්‍රියාත්මක කරනු ලබන "දකුණු ආසියානු ව්‍යවසායකත්ව නායකත්ව" වැඩසටහනෙහි කර්තව්‍යයන් ගණනාවක් අතරට මෙම සහයෝගිතාවය ඇතුළත් වේ.*

කොළඹ, 2021 නොවැම්බර් –

2018 වර්ෂයේ දී සිදු කරන ලද අධ්‍යයනයකට අනුව, ස්වයං රැකියාව පරමාදර්ශී වෘත්තීයයක් ලෙස සලකනු ලබන්නේ ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව අතුරින් 30% කටත් අඩු ප්‍රමාණයකි. ශ්‍රී ලංකාව තුළ, ව්‍යවසායකයකු වීම අවදානම් සහිත, අස්ථාවර වෘත්තීමය තේරීමක් ලෙස තවමත් සලකනු ලබන අතර, රාජ්‍ය අංශයේ රැකියා සඳහා නැඹුරුතාවයක් පවතී. එහි ප්‍රතිඵල ලෙස, අවස්ථාවන්වලින් ප්‍රතිලාභ ලබාගැනීමට පෙළඹ වීම වෙනුවට, ජීවනෝපායක අවශ්‍යතාවය නිසා ව්‍යවසායකත්වයට පුද්ගලයන් යොමු වන සංස්කෘතියක් බිහි වීමය.

ඊට ප්‍රතිචාර වශයෙන්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ "දකුණු ආසියානු ව්‍යවසායකත්ව නායකත්ව" (SALE) වැඩසටහන මගින්, ව්‍යවසායක ලෝකයට තරුණ තරුණියන්ගේ පිවිසීම ඉහළ නැංවීමට සහ උපාය මාර්ගික මැදිහත්වීම් ගණනාවක් හරහා ව්‍යවසායක පරිසර පද්ධතියේ වෙනසක් ඇති කිරීමට කටයුතු කරනු ඇත. ඒ අතුරින් එක් පියවරක් වශයෙන්, දේශයේ තරුණ ප්‍රජාව අතර ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ ව්‍යවසාය අපේක්ෂකයන් සඳහා වඩාත් පහසුකාරක පරිසරයක් නිර්මාණය කිරීම පිණිස ලංකා වාණිජ මණ්ඩලය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලය අතර දෙවසරක් සඳහා වන හවුල්කාරිත්වය ප්‍රධාන වනු ඇත.

"ශ්‍රී ලංකාව තවමත් ව්‍යවසායකත්වයේ පූර්ණ ශක්‍යතාවය ප්‍රයෝජනයට ගෙන නැහැ. මෙම තත්ත්වය නව්‍ය අදහස්වල හිඟයක් හෝ තරුණයන් තුළ උද්‍යෝගයේ ඌනතාවයක් නිසා ඇති වූවක් නොවෙයි, පරමාදර්ශී ව්‍යවසායක පරිසර පද්ධතියක් නොමැති වීමේ ප්‍රතිඵලයක්," යැයි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින බාර අධ්‍යක්ෂිකා සිම්රින් සිං මහත්මිය පැවසුවාය. "කොවිඩ්-19 හේතුවෙන්, විශේෂයෙන් ඩිජිටල් ආර්ථිකයේ අවස්ථා ද ඇතුළුව, නව්‍යකරණ චින්තනයක අවශ්‍යතාවයක් සහ නව ව්‍යාපාරික විසඳුම් හා සේවා සඳහා වේගවත් අවශ්‍යතාවයක් නිර්මාණය වී තිබෙනවා. ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, ආකල්ප වර්ධනය සහ ආධාරක පද්ධති නිර්මාණය කරමින්, තරුණ ප්‍රජාවට අවශ්‍ය ප්‍රවේශය, සම්පත් හා කුසලතා ලබා දීමට අපගේ උත්සාහයන් පුළුල් කිරීමට අවශ්‍ය යි."

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග හවුල්කාරිත්වය පිළිබඳව අදහස් දක්වමින්, ලංකා වාණිජ මණ්ඩලයේ මහ ලේකම් සහ ප්‍රධාන විධායක නිලධාරී මංජුල ද සිල්වා මහතා මෙසේ පැවසීය. "ආර්ථික සංවර්ධනයේ වැදගත්ම උත්ප්‍රේරකය ලෙස අපි දකින්නේ ව්‍යවසායකත්වය වන අතර, අගය එකතු කිරීම සඳහා අනෙකුත් සම්පත් බලමුළු ගැන්වීම සිදු කරන්නේ ව්‍යවසායකයායි. තරුණ ප්‍රජාව අතර මෙන්ම ඔවුන්ගේ මූලික බලපෑම්කරුවන් වන දෙමව්පියන් හා ගුරුවරුන් අතර ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම, නව ව්‍යාපාර බිහිවීමේ ප්‍රවණතාවයක් ඇති කිරීමට උපකාරී වේ. මෙරට තරුණ තරුණියන්ට අඛණ්ඩව ප්‍රතිලාභ ලබා දිය හැකි මෙවැනි ව්‍යාපෘතියක් සමග සම්බන්ධ වී කටයුතු කිරීමට ලැබීම ලංකා වාණිජ මණ්ඩලයේ අපට මහත් සතුටක්."

තරුණ ව්‍යවසායකත්වය ඉහළ නැංවීම සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් ගනිමින්, SALE වැඩසටහන මගින් ඉහළ ද්විතීයික පාසල්, විශ්ව විද්‍යාල සහ තෘතීයික අධ්‍යයන ආයතනයන් වෙත ව්‍යවසායක්ව විෂයමාලා

හඳුන්වා දීම; තෝරාගනු ලබන ප්‍රතිලාභීන්හට ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රමුඛතම 'Start and Improve Your Business' (SYIB) පුහුණු වැඩසටහනෙහි ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව සැලසීම; පෞද්ගලික අංශය වෙතින් උපදේශනය ලබා දීම; ජාතික ආර්ථිකය තුළ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමේ බලපෑම් පිළිබඳ ප්‍රතිපත්තිමය සංවාද හා සංසදයන් මෙහෙයවීම; සහ පුළුල් මහජන දැක්මක් හා තරුණ ව්‍යවසායකයන්හට සහායක් සඳහා උපදේශන හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි සේවා රැසක් සැපයේ.

“අමෙරිකානු ජනාධිපති ජෝ බයිඩන් මහතා, ‘අපගේ ආර්ථිකය ප්‍රතිස්ථාපනය කිරීම යනු අපගේ කුඩා ව්‍යාපාර ප්‍රතිස්ථාපනය කිරීමයි’ යනුවෙන් ප්‍රකාශ කර ඇත. ඒ අනුව, කුඩා ව්‍යාපාර වර්ධනය කිරීම තමන්ගේම ප්‍රකෘතිභාවයට පත්වීමේ මූලෝපාය ලෙස එක්සත් ජනපද රජය විසින් හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම, කාන්තාවන් හා දුෂ්කරතාවයන්ට ලක්වූ ප්‍රජාවන් ද අයත් වන පරිදි ආර්ථිකය ශක්තිමත් කිරීමට සහ ඇතුළත්කරණය වඩාත් වැඩි කරලීමට, ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග හවුල් වීමට ලැබීම පිළිබඳව කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය සතුටට පත්වන බව, එහි ආර්ථික ප්‍රධානී පිලිප් ලූස්ලි මහතා පවසයි.

රැකියා උත්පාදනය හා සුනිසි රැකියා අවස්ථා සඳහා ඇති ශක්‍යතාවයෙන් ඔබ්බට යමින්, ව්‍යවසායකත්වය මඟින් පවතින සමාජ-ආර්ථික බාධක දුරැලීමට, නව චින්තනයක් ගොඩ නැඟීමට, ගැටළුවලට පූර්ව විසඳුම් සැපයීමට, මෙන්ම නිරන්තර වෙනසකට මඟ පාදයි. යෞවනයන්ගේ නිර්මාණශීලීත්වය, ක්‍රියාශීලීත්වය සහ කුසලතා සමග ඒකාබද්ධ වූ විට, එය 2030 තිරසර සංවර්ධන න්‍යායපත්‍රයේ අභිලාෂයන් කරා ළඟාවීමට මග පෑදිය හැකි බලවත් බලවේගයක් නිර්මාණය කරන්නේය.